**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :-09/2001**

මගේ අංකය :- ආVIII/04/03(02)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001.05.21

අමාත්‍යාංශ ලේකම්වරුන්,පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභා ලේකම්වරුන්.

**අංක 1094/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී**
**<u>ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම</u>**

අංක 04/2000 දරණ 2000.01.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් සංශෝධිත 1999.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1094/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**02. 8.3 ඡේදය**

8.3 (ආ) උප ඡේදයට ඉක්බිතිවම පහත දක්වෙන (ඇ),(ඈ) සහ (ඉ) යන උප ඡේද ඇතුලත් කරනු ලැබේ.

(ඇ) විශේෂ පන්තියේ අනුමත තනතුරු සංඛ්‍යාව 05 කට වඩා අඩුවේ නම් ඉහත (අ) හා (ආ) උප ඡේදවල දක්වා ඇති ප්‍රතිශතයන් අදල නොවේ. නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත තනතුරු වල අදළ පුරප්පාඩු පිරවීම සිදු කළ යුතුය.

(ඈ) විශේෂ පන්තියේ අනුමත තනතුරු සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි වුවද එම වර්ෂයේ පුරප්පාඩු වූ තනතුරු සංඛ්‍යාව 04 ක් හෝ එයට අඩු නම් පුරප්පාඩු පිරවීම කළයුත්තේ සුදුසුකම් ලබන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය පදනම් කරගෙනය.

(ඉ) විශේෂ පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා වාර්ෂිකව පවත්වන තරඟ විභාගයේ ප්‍රථිඵල අදල කර ගත යුතු වන්නේ එම වර්ෂයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට පමණි.

**03. 9.0 (II) උපඡේදය**

**(I) 9.0** (II) උප ඡේදයට පහත සඳහන් සටහන් ඇතුලත් කරනු ලැබේ.

**සටහන 1 :-** 1994.07.01 සිට 1999.08.23 දක්වා කාල සීමාව තුල වයස අවුරුදු 45 සම්පූර්ණ වූ නිලධාරියකු එසේ වයස අවුරුදු. 45 සම්පූර්ණ වූ දින සිට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**සටහන 2 :-** 1994.07.01 දිනට පෙර වයස අවුරුදු 45 සම්පූර්ණ වූ නිලධාරියකු 1994.07.01 දින සිට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**සටහන 3 :-** සංශෝධිත ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළ 1999.08.23 දිනෙන් පසු වයස අවු. 45 සම්පූර්ණ වීම මත කිසිම නිලධාරියකු කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු නොලැබේ.

**(II)** 9.0 (IV) උප ජේදයට පහත සඳහන් සටහන ඇතුලත් කරනු ලැබේ.

**සටහන :-** සේවයේ II පන්තියේ "අ'' බණ්ඩයේ නිලධාරීන්ට මෙන්ම II පන්තියේ "ආ'' බණ්ඩයේ නිලධාරීන්ටද දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයට පෙනී සිටිය හැක.

**04. 9.0 (V) උපජේදය**

9.0 (V) උප ජේදය වෙනුවට පහත සඳහන් උප ජේදය ආදේශ කරනු ලැබේ.

I වන පංතියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා කළමනාකරණය සහ අභියෝග්‍යතාවය යන විෂයයන්ට අදල ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත විභාගයක් මණ්ඩලයේ මග පෙන්වීම යටතේ වාර්ෂිකව විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. විශේෂ පන්තියේ පුරප්පාඩු වලින් 40% ක් පුරවනු ලබන්නේ උක්ත විභාගයෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබා ගත්, සුදුසුකම් ලැබූ නිලධාරීන් අතුරිනි. එසේද වුවත් 2000 වර්ෂයද ඇතුළුව 2020 ලිත් වර්ෂයේ අවසානය දක්වා වාර්ෂිකව විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු පිරවිය යුතු වන්නේ පහත වගුවෙහි දැක්වෙන ප්‍රතිශතයන්ට අදල වන පරිදිය.

| <u>ලිත් වර්ෂය</u> | <u>නියමිත විභාගය සමත්වීම මත</u> | <u>ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතාවය මත</u> |
|---|---|---|
| 2000 | 20% | 80% |
| 2001 | 21% | 79% |
| 2002 | 22% | 78% |
| 2003 | 23% | 77% |
| 2004 | 24% | 76% |
| ↓ | ↓ | ↓ |
| 2020 | 40% | 60% |

2020.12.31 න් පසු ඉදිරියට ව්‍යවස්ථාවේ 8:3 උප ජේදය මගින් දක්වා ඇති ක්‍රමය අනුව විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු පිරවිය යුතුය.

**05. 10.0 ජේදය**

10.0 (I) උපජේදය (I) (අ) ලෙස යලි අංක කරනු ලබන අතර, ඉක්බිතිවම I. (ආ), I. (ඇ) හා I. (ඈ) යන උපජේද අළුතින් ඇතුලත් කරනු ලැබේ.

I. (ආ) මධ්‍යම මට්ටමේ කාර්මික සේවා ව්‍යවස්ථාව යටතේ පවත්වනු ලැබූ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ වලින් සමත් නිලධාරීන් සේවයේ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ වලින් සමත් වූවන් සේ සලකනු ලැබේ.

I. (ඇ) මධ්‍යම මට්ටමේ කාර්මික සේවා ව්‍යවස්ථාව යටතේ පවත්වනු ලැබූ දෙවන දෙපාර්තමේන්තු පරික්ෂණයේ ''ආයතන සංග්‍රහය'' විෂයයෙන් සමත් නිලධාරීන් සේවයේ II පන්තියේ ''අ'' ඛණ්ඩයට නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ ''කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය'' විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

I. (ඈ) මධ්‍යම මට්ටමේ කාර්මික සේවා ව්‍යවස්ථාව යටතේ පවත්වනු ලැබූ දෙවන දෙපාර්තමේන්තු පරික්ෂණයේ ''මුදල් රෙගුලාසි'' විෂයයෙන් සමත් නිලධාරීන් සේවයේ II පන්තියේ ''අ'' ඛණ්ඩයට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ ''මුදල් රෙගුලාසි'' විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

ඉහත සංශෝධන සමග කියවෙන සංශෝධිත ව්‍යවස්ථාවට අනුරූප වන පරිදි ඒ ඒ තනතුරුවල බඳවා ගැනීම් පරිපාටි සංශෝධනය කිරීමට අදල පත් කිරීම් බලධාරීන් පියවර ගත යුතුය.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය